# 3. ඉතිහාසය

01. (i). මහනුවර රාජධානියට අයත්ව තිබූ පාලන ප්‍රදේශ අතුරෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii). මහනුවර යුගයේ පහත සඳහන් කාර්යයන් භාරව කටයුතු කළ තැනැත්තන්ගේ නිල නාම වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න

A - රජතුමාගේ අලි ඇතුන් භාරව කටයුතු කිරීම.

B - රජවාසලට ආහාර පාන සැපයීම.

C - රජතුමාගේ ඇඳුම් හා ආභරණ භාරව කටයුතු කිරීම.

D - කුඩා ම පරිපාලන ඒකකය වූ ගමක් භාරව කටයුතු කිරීම.

(විදානේ, කෝරාළ, සළුවඩන නිලමේ, ගජනායක නිලමේ, බත්වඩන නිලමේ, කොඩිතුවක්කු නිලමේ, දියවඩන නිලමේ) (ලකුණු 04 යි)

(iii). උඩරට සමාජයේ පැවති විවාහ ක්‍රම පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04 යි)

(iv). මහනුවර රාජධානි සමයේ

A - කෘෂිකර්මය

B - කර්මාන්ත

සංවිධානය වී තිබූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(v). උඩරට නව රාජ වංශයක් ආරම්භ කරමින් බලයට පත් වූ 1 වන විමලධර්මසූරිය රජුට

(a). මුහුණ දීමට සිදු වූ අභියෝග දෙකක් ද,

(b). අභියෝග ජය ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් ද දක්වන්න. (ලකුණු 05)

(vi). නායක්කර් රජවරු හින්දු භක්තිකයන් වුව ද බුද්ධාගමේ උන්නතිය සඳහා අවශ්‍ය පියවර ගැනීමෙන් ඔවුහු උත්සුක වූහ. බුද්ධාගමේ උන්තිය සඳහා නායක්කාර වංශික රජවරුන් දෙදෙනෙකු ගත් ක්‍රියා මාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

02. (i). මහනුවර නගරයට ගඟකින් හා කඳුවැටි දෙකකින් ආරක්ෂාව ලැබෙයි. ඒවා පිළිවෙළින් සඳහන් කරන්න.

(ii). මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ නම් 4 ක් ලියන්න.

(iii). උඩරට රාජධානියේ පැවති සමාජ ක්‍රමයේ ස්ථර තුනක් දක්නට ලැබුණි. ඒවා නම් කරන්න.

(iv). මහනුවර යුගයේ කෘෂි කර්මාන්තයේ හා වෙළෙඳාමේ ලක්ෂණ දෙක බැගින් වෙන වෙනම ලියන්න.

(v). මහනුවර යුගයේ චිත්‍ර කලාවේ ලක්ෂණ 5 ක් ලියන්න.